ළදේ නිසරු නොකරන් අප සියලා

**සිංහල - 10 ශ්‍රේණිය**

**II වාරය**

**නිපුණතාව** - 11.0 රසඥතාව වර්ධනය සඳහා සාහිත්‍ය නිර්මාණ පරිශීලනය කරයි.

**නිපුණතා මට්ටම -** 11- 2 සාහිත්‍ය නිර්මාණ රසාස්වාදයේ යෙදෙයි.

**ඉගෙනුම් පල** -

- පද්‍ය නිර්මාණ රස විඳිමින් ගායනා කරයි.
- සාහිත්‍ය නිර්මාණ කියවා අගය කරයි.
- කාව්‍යෝපක්‍රම හා ශිල්ප ක්‍රම භාවිත කර ඇති ආකාරය විමර්ශනය කරයි.
- රසාස්වාදය සඳහා නිර්මාණ ඇසුරු කරයි.

## ක්‍රියාකාරකම - 1

- **කෙටි පිළිතුරු සපයන්න.**

1. "වෙස්සන්තර ජාතක කාව්‍යය" රචනා කිරීමට පාදක වී ඇති මූලාශ්‍ර ග්‍රන්ථ දෙක නම් කරන්න.

   I. ..........................................................................................

   II. ........................................................................................

2. එය කුමන සාහිත්‍ය යුගයක රචනා වන්නට ඇතැයි සැලකේ ද?

   ........................................................................................................................

3. මේ කෘතිය කුමන සාහිත්‍ය ගණයකට අයත් ද ?

   ........................................................................................................................

4. මෙහි කතුවරයා ගැන කිව හැකි කරුණු දෙකක් සඳහන් කරන්න.

   I. ........................................................................................................

   II. ......................................................................................................

5. ඔබේ පාඩමට අදාළ කවිවලින් කියැවෙන්නේ කුමක් ගැන ද? කෙටියෙන් විස්තර කරන්න.

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

## ක්‍රියාකාරකම - 2

- **පහත සඳහන් අදහස සහිත පද්‍ය පාද වරහනින් තෝරා ලියන්න.**

1. නුඹ වහලියකගේ දුක් විඳින්නෙහි ය.

..............................................................................................................................

2. හිසත් රැවුළත් පැසී ඇති අතර කම්මුල් හැකිළී ගොසිනි.

..............................................................................................................................

3. කුදු ගැසීගෙන වෙවුලමින් නැගිටියි.

..............................................................................................................................

4. හිසකෙස් අගින් පුපුරා ඇති අතර දත් කැඩී ගොසිනි.

..............................................................................................................................

5. පර වූ මල් පූජා කිරීමේ විපාක පල දී ඇත.

..............................................................................................................................

6. රැවුළ පැසී ඇත. දත් ඉදිරියට නෙරා ඇත..........කටින් කෙළ වැගිරෙයි.

..............................................................................................................................

7. ඇනුම් යන විට මුඛය දුර්ගන්ධ නොවේ ද ?

..............................................................................................................................

8. ඒ වචනවලින් තරුණ බැමිණිය ලජ්ජාවට පත් වූවා ය.

..............................................................................................................................

9. ඇඳෙහි නිදා සිටි බමුණා බිම පෙරළා දැමුවා ය

..........................................................................................................

10. අම්හිරි වචනවලින් බැණ වැදුණා ය.

..........................................................................................................

(එ බසට ලජ්ජාවෙන් ලද බැමිණි, වාල් විදින දුක මෙනුඹ විඳින්නේ, කුදේ ගැසී නැගිටින කළ වෙවුලා, කන් කටුවට කරදර තෙපලන්නී, පැසි ඉසත් නිකටත් සොඬු ඇකිළේ, පරමල් පිදුවාදෝ පල දුන්නේ ,යානේ උන් බමුණා බිම පෙරළා, ආනන කල උගේ කට ගඳ නැද්දෝ, ඉසකේ පුපුරටි දත් කඩ තොල්ලා ,පැසී නිකට දත් බොල්ලෑ කෙළ තොලු )

## ක්‍රියාකාරකම - 3

- **අදහස දෙන පද යා කරන්න.**

| | |
|---|---|
| 1. දාස | 1. සොඬු |
| 2. කම්මුල් | 2. නර මුල් |
| 3. වියළි ගොම කැබලි | 3. කන්සෙට |
| 4. පැසුණු හිසකෙස් | 4. කන් කටුවට |
| 5. කෝපයෙන් | 5. වැරටිල්ලා |
| 6. ඇතුළු වී | 6. විලි වැද |
| 7. කම්මුලට | 7. ජාතියෙ |
| 8. කනට අම්හිරි | 8. වාල් |
| 9. ලැජ්ජා වී | 9. රොස් වී |
| 10. හවයේ | 10. වැදිලා |

## ක්‍රියාකාරකම - 4

- **පහත සඳහන් පදවලට සමානාර්ථ පද පාඩමෙන් සොයා ලියන්න.**

1. ස්වාමියා ..........................................................................
2. සුදුසු ද ..........................................................................
3. මේ කාලයේ ..........................................................................
4. කාන්තාවෙනි ..........................................................................

5. ප්‍රාර්ථනා කළා ………………………………………………………………………

6. ඇතුළු වූවා ය ………………………………………………………………………

7. ප්‍රකාශ කරන්නී ………………………………………………………………………

8. සයනයෙහි ………………………………………………………………………

9. එළියෙන් ………………………………………………………………………

10. ගර්වයෙන් ………………………………………………………………………

## ක්‍රියාකාරකම - 5

- **රිද්මය හා එළිසමය ආරක්ෂා කිරීමට කවියා ඇතැම් පද විකෘති කරයි. පහත සඳහන් පද සඳහා එසේ යෙදුණු පද වරහනින් තෝරා ලියන්න.**

1. වහල් - ……………………………………………………………
2. හැකිළී - ……………………………………………………………
3. නිසි - ……………………………………………………………
4. පටල - ……………………………………………………………
5. සියලු - ……………………………………………………………
6. නැද්ද ……………………………………………………………
7. යහනෙහි - ……………………………………………………………
8. වැරටි - ……………………………………………………………
9. කොළ තොලු - ……………………………………………………………
10. ඉතින් - ……………………………………………………………
11. බකල් - ……………………………………………………………
12. මෙකල - ……………………………………………………………
13. කුදු - ……………………………………………………………
14. පිදුවාද - ……………………………………………………………
15. එඩින් - ……………………………………………………………
16. රවුළ - ……………………………………………………………
17. ලෙසින් - ……………………………………………………………
18. මා - ……………………………………………………………

( වාල්, කෙළ තොල්ලා, මෙකලා, ඉතිනේ, පිදුවාදෝ, එඩිනි, නිසී, පටලේ, යානේ, වැරටිල්ලා, මන්, රවුළා, නැද්දෝ, බකලේ, කුදේ, හැකිළේ, සියලා, ලෙසිනි )

## ක්‍රියාකාරකම - 6

**ජූජක බමුණාගේ කිනම් ශරීර ලක්ෂණ කවි පෙළෙන් හෙළිදරව් වේ දැයි (ආ) කොටසින් සොයා ලියන්න.**

**(අ)**

1. පැසී ඉසත් නිකටත්

   ..........................................................................................................

2. සොඬු ඇකිළේ

   ..........................................................................................................

3. කුදත් ගැසී

   ..........................................................................................................

4. බකලේ ගමනත්

   ..........................................................................................................

5. නැගිටින කල වෙවුලා

   ..........................................................................................................

6. කැසිත් කැස

   ..........................................................................................................

7. බඩවක පිටවක සන් වැරටිල්ලා

   ..........................................................................................................

8. පුපුරැටි ඉසකේ

   ..........................................................................................................

9. දත් කඩ තොල්ලා

   ..........................................................................................................

10. කෙළ තොල්ලා

    ..........................................................................................................

11. ඇඟ ඇට කිඹුලෙකු වැන්නේ

    ..........................................................................................................

12. සුදු රළු ඉසකේ

    ..........................................................................................................

13. දත් බොල්ලෑ

..........................................................................................................................................

14. වැසී තිබෙන ඇස්

..........................................................................................................................................

15. ගැට කෝනමෙකුට

..........................................................................................................................................

**(ආ)**

1. කම්මුල් හැකිලී ගොස් ය.
2. කොන්දෙහි ගැට මතු වූ තැනැත්තෙකි
3. කොණ්ඩය හා රැවුළ පැසී ඇත
4. ඇවිදින විට බකල ය.
5. දත් ඉදිරියට නෙරා ඇත.
6. දත් කැඩී ඇත.
7. හිසකෙස් අග පුපුරා ඇත.
8. කුදු ගැසී ඇවිදියි.
9. කට දෙපසින් කෙළ වැගිරෙයි.
10. කිඹුලෙකුගේ මෙන් සිරුරෙහි ඇට මතු වී ඇත.
11. හිසකෙස් සුදු ය; රළු ය.
12. ඇස් වැසී තිබේ.
13. උදරයේ හා පිටේ සමෙහි පොතු ගැලවෙයි.
14. නැගිටින විට වෙවුලයි.
15. නිතර කැස්ස පවතී.

## පිළිතුරු

## ක්‍රියාකාරකම - 1

1.

I. පන්සිය පනස් ජාතක පොත
II. බුත්සරණ

2. මහනුවර රාජධානි සමය

3. චූල සම්ප්‍රදාය

4. I.සිංහල භාෂාව පිළිබඳ මනා පරිචය

II.විශිෂ්ට ප්‍රතිභානය

6. වියපත් ජූජක බමුණා අමිත්තතාප අවාහ කරගනී. ඇය බමුණාට හොඳින් සලකයි. එය නුරුස්සන අසල්වැසි ස්ත්‍රී හු ඇයට ඒ ගැන දොස් පවරන ආකාරයක් ඊට අමිත්තතාපගේ ප්‍රතික්‍රියාවක් මේ කවිවලින් විස්තර වේ.

## ක්‍රියාකාරකම - 2

1. වාල් විඳින දුක මෙනුඹ විඳින්නේ
2. පැසී ඉසත් නිකටත් සොඹු ඇකිලේ
3. කුදේ ගැසී නැගිටින කල වෙවුලා
4. ඉසකේ පුපුරැටි දත් කඩ තොල්ලා
5. පරමල් පිදුවා දෝ පල දුන්නේ
6. පැසී නිකට දත් බොල්ලැ කෙළ තොලු
7. ආනන කළ උගෙ කට ගඳ නැද්දෝ
8. එ බසට ලජ්ජාවෙන් ලද බැමිණි
9. යානේ උන් බමුණා බිම පෙරළා
10. කන් කටුවට කරදර තෙපලන්නී

## ක්‍රියාකාරකම - 3

1. - 8
2. - 1
3. - 5
4. - 2
5. - 9
6. - 10
7. - 3
8. - 4
9. - 6
10. - 7

## ක්‍රියාකාරකම - 4

1. හිමි
2. ඔබිනව
3. මෙකලා
4. ළදේ
5. පැතුවා
6. වැදුණා
7. තෙපලන්නී
8. යානේ
9. ලැජ්ජාවෙන්
10. එඩිනි

## ක්‍රියාකාරකම - 5

1. වාල්
2. හැකිළේ
3. නිසි
4. පටලේ
5. සියලා
6. නැද්දෝ
7. යානේ
8. වැරටිල්ලා
9. කෙළ තොල්ලා
10. ඉතිනේ
11. බකලේ
12. මෙකලා
13. කුදේ
14. පිදුවාදෝ
15. එඩිනි
16. රවුළා
17. ලෙසිනි
18. මන්

**<u>ක්‍රියාකාරකම - 6</u>**

| | | | | | |
|---|---|---|---|---|---|
| 1. | - | 3 | 9. | - | 6 |
| 2. | - | 1 | 10. | - | 9 |
| 3. | - | 8 | 11. | - | 10 |
| 4. | - | 4 | 12. | - | 11 |
| 5. | - | 14 | 13. | - | 5 |
| 6. | - | 15 | 14. | - | 12 |
| 7. | - | 13 | 15. | - | 2 |
| 8. | - | 7 | | | |